4 ව්‍යාපාර සැලැස්ම සඳහා ගිණුම්කරණයේ පදනම



හැඳින්වීම

ගිණුම්කරණයේ කාර්ය භාරය පැහැදිලි කිරීමත් වත්කම්, හිමිකම්, වගකීම් යන මේවා හඳුනා ගැනීම හා ව්‍යාපාරික ගනුදෙනු ඒවා කෙරෙහි ඇති කරන බලපෑම විග්‍රහ කිරීමත් එමගින් ගනුදෙනුවක ද්විත්ව බලපෑම අනාවරණය කර ගැනීමත් කළ යුතු වේ.

මූලාශ්‍ර ලේඛන පදනම් කර ගනිමින් ව්‍යාපාරික ගනුදෙනුවලින් ආදයම් ප්‍රකාශය ද ශේෂ පත්‍රය ද ගිණුම්කරණ යෙදවුම්වලින් පිළියෙල කළ හැකි වේ.

ව්‍යාපාර සැලසුම් පිළියෙල කිරීමේ දී මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ගිණුම්කරණ පදනම සකස් කිරීම මේ පරිච්ඡේදයෙන් සිදු කැරේ.

ගිණුම්කරණයේ කාර්ය භාරය

ඕනෑ ම ව්‍යාපාරයක ප්‍රධානතම කාර්යය වන්නේ අපේක්ෂිත ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීම සඳහා සීමිත සම්පත් කාර්යක්ෂම ව හා සඵලදායි ලෙස යොද ගැනීමයි.

මේ සම්පත්වල දැකිය හැකි වැදගත් ම ලක්ෂණය වන්නේ ඒවායේ සීමිත බවයි. සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමේ දී එකී සම්පත් කළමනාකරණයට යටත් කළ යුතු අතර ඒ සඳහා ගිණුම්කරණයේ අවශ්‍යතාව ඉස්මතු වේ.

ගිණුම්කරණය ව්‍යාපාරිකයකුට වැදගත් වන ආකාරය

ගිණුම්කරණය ව්‍යාපාරිකයකුට ආකාර කිහිපයකින් වැදගත් වේ. ඒවා පහත දැක්වේ,

- තොරතුරු අවශ්‍ය පාර්ශ්ව වෙත ලබා දීම
- ව්‍යාපාරයේ තත්ත්වය වෙනත් ව්‍යාපාරවල තත්ත්වය සමඟ සැසඳීම
- තීරණ ගැනීම
- නීතිමය අවශ්‍යතා සපුරා ලීම.

හිමිකරුවන්, කළමනාකරුවන්, අනාගත ආයෝජකයන්, ණය හිමියන් ආදි පාර්ශ්ව ව්‍යාපාරයේ කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන බැවින් ඔවුනට ආර්ථිකමය තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු ගිණුම්කරණයෙන් ලබා දේ.

ව්‍යාපාරයේ ලාභදායිත්වය, ද්‍රවශීලතාව, මූල්‍ය තත්ත්වය ආදිය සම්බන්ධයෙන් කොතෙක් දුරට සාර්ථකත්වයක් ලබා තිබේ ද යන්න අතීත ගිණුම් වාර්තා සමඟ සැසඳීමෙන් දැන ගත හැකි ය. ඒ හැර වෙනත් සමාන තරගකාරි ව්‍යාපාරවල ගිණුම් වාර්තා සමඟ සැසඳීමට ද හැකි වේ.

ලාභදායිත්වය යනු ඉපැයූ ලාභය විකුණුම්වලට හෝ යෙදැවූ ප්‍රාග්ධනයට හෝ කෙතරම් ද යන්න වේ. එදිනෙදා මට්ටමේ කටයුතු පවත්වා ගෙන යාමට ඇති මූල්‍ය ශක්තිය ද්‍රවශීලතාව ලෙසත් වත්කම්, හිමිකම් හා වගකීම් මූල්‍ය තත්ත්වය ලෙසත් හැඳින්වේ.

ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉදිරියේ දී කළ යුත්තේ කුමක් ද කවර ආකාරයෙන් ද යන ආදි තීරණ ගැනීම කළ හැකි වේ.

ණය ලබා ගැනීම්, ආදායම් බදු ගෙවීම් යන ආදි කාර්යවල දී ගිණුම් වාර්තා ඉදිරිපත් කළ යුතු බැවින් නීතිමය අවශ්‍යතා සපුරා ලීම කළ හැකි වේ.

ගිණුම්කරණය යනු කුමක් ද යන්න සරල ව හඳුනා ගනිමු.

ව්‍යාපාරයක සිදු වන ගනුදෙනු පොත්වල වාර්තා කිරීමත් ඒවායින් ගිණුම් වාර්තා සැකසීමත් ගිණුම්කරණය ලෙස සරල ව හැඳින්විය හැකි ය.

ගිණුම්කරණයට අදාළ කාර්ය භාරය පහත සඳහන් පරිදි සාරාංශ කළ හැකි වේ.



ඉහත දැක්වූ කරුණු එකින් එක සලකා බලමු.

තොරතුරු රැස් කිරීම

ව්‍යාපාරික ගනුදෙනුවලටත් සිදු වීම්වලටත් අදාළ තොරතුරු මූලික වශයෙන් ඇතුළත් වන්නේ මූලාශ්‍ර ලේඛනවල ය. ඒ මූලාශ්‍ර ලේඛන රැස් කිරීමෙන් ගිණුම් කාල සීමාවට අදාළ වටිනාකම් ගණනය කළ හැකි වේ.

වාර්තා කිරීම

මූලාශ්‍ර ලේඛන මඟින් රැස් කර ගන්නා තොරතුරු සටහන් කිරීමට ගැනෙන පොත් මූලික පොත් වේ. උපයෝගි පොත්, ජ' නල, දෛනික පොත් යන නම්වලින් හැඳින්වෙන්නේ එකී පොත් ම ය.

ආයතනයක සිදු වන ගනුදෙනු ගිණුම්වල සටහන් කිරීමට පෙර ඇතුළත් කැරෙන පොත් මූලික පොත් වේ. මූලාශ්‍ර ලේඛනවලින් උපුටා ගැනෙන එක ම වර්ගයට අයත් ගනුදෙනු ඒවා සිදු වූ දින අනුපිළිවෙළට සටහන් කැරේ. ගැනුම් පොත, විකුණුම් පොත, මුදල් පොත, යන මේවා නිදසුන් ය.

වර්ග කිරීම

උපයෝගි පොත්වල සටහන් කළ දත්ත විවිධ ලෙජර ගිණුම්වලට බෙදා දැක්වීම, වර්ග කිරීම වේ. ඉන් පසු ඒවා ගිණුම්වලට පිටපත් කැරේ.

සාරාංශ කිරීම

ආර්ථික තීරණ ගැනීමට උපකාරි වන ගිණුම් තොරතුරු සම්පිණ්ඩනය කර ඉදිරිපත් කිරීම, සාරාංශ කිරීම වේ. මේ සඳහා ගිණුම් වාර්තා (මූල්‍ය ප්‍රකාශ) යොදා ගැනේ.

නිදසුන් ඃ ආදායම් ප්‍රකාශය
ශේෂ පත්‍රය.

විශ්ලේෂණය හා විවරණය

ගිණුම් වාර්තාවලින් ඉදිරිපත් කැරෙන තොරතුරු තව දුරටත් පැහැදිලි කර ඉදිරිපත් කිරීම විශ්ලේෂණය හා විවරණය කිරීම වේ. මේ සඳහා ගිණුම්කරණ අනුපාත භාවිතයට ගැනීම බොහෝ විට සිදු වේ.

නිදසුන් ඃ වර්ෂය තුළ ඉපැයූ ශුද්ධ ලාභය රු 50 000කි. රු 500 000ක මුදලක් ආයෝජනය කර තුබුණි. ඉපැයූ ශුද්ධ ලාභය ආයෝජනය කළ මුදලේ ප්‍රතිශතයක් ලෙස දැක් වූ විට;

$$\frac{\text{ශුද්ධ ලාභය}}{\text{ආයෝජනය කළ මුදල}} \times 100$$

$$\frac{50\ 000}{500\ 000} \times 100 = \underline{\underline{10\%}}$$

තොරතුරු සන්නිවේදනය කිරීම

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්ව වෙත මූල්‍ය වාර්තාවලින් තොරතුරු සැපයීම මෙයින් අදහස් කැරේ. එය සන්නිවේදනය වේ.

ගිණුම්කරණ සමීකරණය

සමීකරණයක් යනු විචල්‍ය දෙකක් අතර පවත්නා ශ්‍රිතීය සම්බන්ධතාව යි. විචල්‍යයක් යනු වෙනස් වන දෙයකි. ගිණුම්කරණයේ දී ව්‍යාපාරය එහි හිමිකරුවන්ගෙන් වෙන් ව පවතින ස්වාධීන ඒකකයක් ලෙස සැලකේ. මෙය ගිණුම්කරණ ඒකක සංකල්පය වේ. මේ අනුව ව්‍යාපාරික ගනුදෙනු, ගිණුම් වාර්තා යන ආදි සියල්ල ම ව්‍යාපාරික මුහුණුවරින් දක්වේ.

ගිණුම්කරණ සමීකරණයෙන් දක්වෙන විචල්‍ය දෙක වන්නේ,

ව්‍යාපාරයේ වත්කම්

වත්කම් යෙදැවූ පාර්ශ්වවලට ව්‍යාපාරයේ ඇති බැඳීම යන ඒවායි.

මේ අනුව ව්‍යාපාරයේ සම්පත් හා සම්පත් සපයන පාර්ශ්වවලට එකී සම්පත් සම්බන්ධයෙන් ව්‍යාපාරයේ ඇති බැඳීම පිළිබිඹු කැරෙන ගණිතමය ඉදිරිපත් කිරීම ගිණුම්කරණ සමීකරණය වේ.

මෙතැන් සිට ගිණුම්කරණ සමීකරණ ගොඩනැංවෙන ආකාරය සලකා බලමු.

1 පියවර

අයිතිකරු ව්‍යාපාරය සඳහා සම්පත් යෙදවීම

නිදසුන්

ගයාන් රු 150 000ක් යොද ව්‍යාපාරයක් ආරම්භ කිරීම

- ව්‍යාපාරයට රු 150 000 ක මුදල් වත්කමක් ලැබේ.
- ව්‍යාපාරයට රු 150 000ක බැඳීමක් ඇති වේ. එකී බැඳීම හිමිකම වේ. මෙය ප්‍රාග්ධනය නමින් ද හැඳින්වේ.

හිමිකම් (ප්‍රාග්ධනය)	=	**වත්කම්**
රු 150 000	=	රු 150 000



2 පියවර

ව්‍යාපාරය එහි අයිතිකරුවන්ගෙන් පමණක් නොව බාහිර පාර්ශ්වවලින් (නිද . බැංකු) ද සම්පත් ලබා ගනී. එවිට ව්‍යාපාරය බාහිර පාර්ශ්ව කෙරෙහි බැඳීමක් ඇති වේ. මෙම බැඳීම්, වගකීම් වේ.

නි දඃ ගයාන් රු 150 000ක් යොද ආරම්භ කළ ව්‍යාපාරයට රු 50 000ක ණය මුදලක් බැංකුවෙන් ලබා ගෙන ඇත. එවිට සමීකරණය පහත සඳහන් පරිදි වේ.

හිමිකම්	**+**	**වගකීම්**	**=**	**වත්කම්**
ප්‍රාග්ධනය	+	බැංකු ණය	=	මුදල්
රු 150 000	+	රු 50 000	=	රු 200 000

මූලික ගිණුම්කරණ සමීකරණයේ සංරචක

වත්කම්
හිමිකම්(ප්‍රාග්ධනය)
වගකීම්.

වත්කම්

ගිණුම්කරණ ඒකකයක් (ව්‍යාපාරයක්) සතු ව පවතින ආර්ථික සම්පත්, වත්කම් වේ.
වත්කමක පහත දැක්වෙන ලක්ෂණ තිබිය යුතු ය

එය අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස බිහි වීම
අනාගතයේ දී ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ලබා දීම
එහි පිරිවැය විශ්වසනීයතාවකින් මැනිය හැකි වීම
නීතිමය වශයෙන් ව්‍යාපාරයට හිමි වීම
ව්‍යාපාරයේ පාලනයට නතු වීම.

ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය මත සිදු වන වෙනස් වීම්වලට අනුව වත්කම් කොටස් දෙකකට පහත සඳහන් අයුරු බෙදිය හැකි ය.



ජංගම වත්කම්

මාස 12ක් හෝ එයට වඩා අඩු කාලයක් හෝ පවතින, එදිනෙදා ව්‍යාපාරික කටයුතු නිසා විශාල වශයෙන් වෙනස් වීමක් සිදුවන වත්කම්, ජංගම වත්කම් වේ.

කෙටි කාලීන වත්කම්, ද්‍රවශීල වත්කම් ආදි නම්වලින් ද ජංගම වත්කම් හැඳින්වේ. ජංගම වත්කම්වල කැපී පෙනෙන ලක්ෂණ කීපයක් පහත දක්වා ඇත.

එදිනෙදා ව්‍යාපාර කටයුතු (මෙහෙයුම් කටයුතු) නිසා විශාල වශයෙන් වෙනස් වීම්වලට ලක් වීම

ශේෂ පත්‍ර දින සිට මාස 12ක් හෝ එයට වඩා අඩු කාලයක් හෝ පැවතීම

සාපේක්ෂ වශයෙන් ද්‍රවශීලතාව ඉහළ මට්ටමක පැවතීම.

නිදසුන් ඉතුරු භාණ්ඩ තොග, ණය ගැතියෝ, ලැබිය යුතු ආදායම, ඉදිරියට කළ ගෙවීම්, අත ඉතුරු මුදල්, බැංකු මුදල්.

ජංගම නොවන වත්කම්

මාස 12 කට වැඩි කාලයක් පවතින එදිනෙදා ව්‍යාපාර කටයුතු නිසා විශාල වෙනසක් ඇති නොවන වත්කම්, ජංගම නොවන වත්කම් ලෙස සරල ව හැඳින්විය හැකි ය.

ඒවා ස්ථාවර වත්කම්, දිගුකාලීන වත්කම්, යන ආදි නම්වලින් ද හැඳින්වේ. ජංගම නො වන වත්කම්වල කැපී පෙනෙන ලක්ෂණ කීපයක් පහත දක්වා ඇත:

එදිනෙදා මෙහෙයුම් කටයුතු නිසා විශාල වශයෙන් වෙනස් වීම්වලට ලක් නොවීම

ශේෂපත්‍ර දින සිට මාස 12කට (වර්ෂයකට) වැඩි කාලයක් පැවතීම

විකිණීමේ පරමාර්ථයෙන් තොර ව, ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ලබා ගෙන තිබීම (නිෂ්පාදන කටයුතු, පරිපාලන කටයුතු, අන් පුද්ගලයනට කුලියට දීම යන මේවා සඳහා)

සාපේක්ෂ වශයෙන් ද්‍රවශීලතාව අඩු වීම.

නිදසුන් සාමාන්‍ය වෙළෙඳ ව්‍යාපාරයක ඉඩම් හා ගොඩනැගිලි , රථ වාහන , යන්ත්‍ර හා උපකරණ , ලී භාණ්ඩ.

ව්‍යාපාරයක වත්කම්, අයිතිකරුවන්ගෙන් මෙන් ම බාහිර පාර්ශ්වයන්ගෙන් ද සම්පාදනය වේ.

එය පහත සඳහන් අයුරු දැක්විය හැකි වේ;

වත්කම් = හිමිකම් + වගකීම්

හිමිකම් (ප්‍රාග්ධනය)

ශුද්ධ වත්කම්, ඇල්ම යන නම්වලින් ද හිමිකම හැඳින්වේ.

ආයතනයක සියලු ම වත්කම්වලින් එහි සියලු ම බාහිර බැරකම් හෙවත් වගකීම් අඩු කළ පසු ලැබෙන අගය හිමිකම් ලෙස සැලකේ.

එය පහත සඳහන් අයුරු දැක්විය හැකි ය:

හිමිකම් = වත්කම් - වගකීම්

වගකීම්

ව්‍යාපාරයක මුළු වත්කම්වලින් එහි අයිතිකරුවනට හිමි වටිනාකම ඉවත් කළ විට ලැබෙන මූල්‍ය වටිනාකම, වගකීම් වේ.

වගකීම්වල දක්නට ලැබෙන ලක්ෂණ කීපයක් පහත දැක්වේ.

අතීත ගනුදෙනුවක් තුළින් බිහි වූ බැඳීමක් වීම. බැඳීමක් යනු නිශ්චිත ආකාරයට ක්‍රියා කිරීමට හෝ ඉටු කිරීමට හෝ ඇති වගකීම යි

එකී බැඳීම් නිරවුල් කිරීමේ දී වත්කම්වලින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයෙන් පිටතට ඇදී යාමක් හෝ සම්පත්වල (වත්කම්වල) අඩු වීමක් හෝ සිදු වේ

අදාළ ගෙවීම් ප්‍රමාණය විශ්වසනීයතාවෙන් මැනිය හැකි වීම.
නිදඃ ලබා ගත් රු 150 000ක බැංකු ණයෙන් රු120 000ක් ගෙවීමට තිබීම.

මෙය;

අතීතයේ දී සිදු වූ ගනුදෙනුවකි.

බැංකු ණය තව ම ගෙවා අවසන් කර නැති බැවින් ණය ආපසු ගෙවීමේ වගකීම තව දුරටත් පවතී. එහෙයින් එය වර්තමාන බැඳීමක් වේ.

බැංකු ණය නිදහස් කරන විට වත්කම්වල (මුදල් ආදි) අඩු වීමක් සිදු වේ.

වගකීම් නිදහස් කළ හැකි කාලය අනුව ඒවා පහත සඳහන් පරිදි කොටස් දෙකකට බෙදිය හැකි ය.



මේ එකිනෙක මී ළගට විස්තර කරමු.

ජංගම වගකීම්

ශේෂපත්‍ර දින සිට මාස 12කින් හෝ එයට අඩු කාලයකින් හෝ නිදහස් කළ යුතු වගකීම් ය.

නිදසුන් වෙළෙඳ ණය හිමියෝ, උපචිත වියදම්, බැංකු අයිරාව,ඉදිරියට ලැබූ ආදයම්

ජංගම නොවන වගකීම්

ශේෂපත්‍ර දින සිට මාස 12කට (වර්ෂයකට) වැඩි කාල සීමාවකින් නිදහස් කළ හැකි වගකීම් ය.

නිදසුන් අවු 05කින් ගෙවිය යුතු බැංකු ණය

අවු 02කින් නිදහස් කළ යුතු උකස් ණය

මේ දිගුකාලීන ණය ලබා ගැනීම සඳහා ඇප සුරැකුම් ඉදිරිපත් කිරීමට සිදු වේ.

ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට ඇති කරන බලපෑම

ව්‍යාපාරයත් බාහිර පාර්ශ්වයත් අතර ඇති වන සම්පත් හුවමාරු වීම් හෝ ආර්ථික සිදු වීම් හෝ ගනුදෙනු ලෙස හැඳින්වේ.

නිදසුන ණය හිමියනට රු 15 000ක් මුදලින් ගෙවීම, ණය ගැතියන්ගෙන් රු 5 000ක් බොල් ණය ලෙස කපා හැරීම.

ගනුදෙනු නිසා ව්‍යාපාරයේ වත්කම්, හිමිකම්, වගකීම් යන මේවායේ වෙනස් වීම් ඇති වේ. ඒවා මුදලින් මැනීමට පිළිවන. ව්‍යාපාරයක සිදු වන විවිධ ගනුදෙනු නිසා මූලික ගිණුම්කරණ සමීකරණයට ඇති වන බලපෑම මෙතැන් සිට පැහැදිලි කර ගනිමු.

01. ව්‍යාපාරයේ අයිතිකරු වන ගයාන් රුපියල් 150 000ක් යොද ව්‍යාපාරය ආරම්භ කිරීම.

ගිණුම්කරණ ඒකක සංකල්පය අනුව ව්‍යාපාරය එහි හිමිකරුගෙන් වෙන් ව පවතින ස්වාධීන ඒකකයකි. මේ ගනුදෙනුව නිසා ව්‍යාපාරයට රු 150 000ක මුදල් වත්කමක් ලැබේ. රු 150 000 සඳහා ප්‍රාග්ධන හිමිකමක් ඇති වේ. එවිට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ;

C	=	A
හිමිකම්	=	වත්කම්
ප්‍රාග්ධනය 150 000	=	මුදල් 150 000

02. සුමන බැංකුවෙන් රු 50 000ක ණය මුදලක් ව්‍යාපාරය ලබා ගැනීම.
මේ ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ මුදල් වත්කම් රු 50 000කින් වැඩි වේ. ඒ රු 50 000 ආපසු ගෙවිය යුතු බැවින් බැංකු ණය ආකාරයට වගකීමක් බිහි වේ. එවිට සමීකරණය පහත දැක්වේ;

C	+ L	= A
හිමිකම්	+ වගකම්	= වත්කම්
ප්‍රාග්ධනය 150 000	+ බැංකු ණය 50 000	= මුදල් 200 000

03. විකිණීම සඳහා රු 35 000කට බඩු තොගයක් මිල දී ගැනීම.
මෙහි දී මුදල් වත්කම්රු 35 000කින් අඩු වීමක් සමඟ ම රු 35 000 බඩු තොග වත්කමක් බිහි වේ. හිමිකම්වලත් වගකීම්වලත් වෙනසක් සිදු නො වේ. එවිට සමීකරණය පහත දැක්වේ;

C	+ L	= A	
හිමිකම්	+ වගකීම්	= වත්කම්	
ප්‍රාග්ධනය 150 000	+ බැංකු ණය 50 000	= මුදල්	165 000
		බඩු තොගය	35 000
150 000	50 000		200 000

04. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු 20 000කට යන්ත්‍රයක් මිල දී ගැනීම.
මුදල් වත්කම රු 20 000කින් අඩු වී රු 145 000 බවට පත් වේ. යන්ත්‍ර වත්කම රු 20 000 ලෙස එක් වේ. බඩුතොග හිමිකම් ,වගකීම් යන මේවායේ වෙනසක් නැත. එවිට සමීකරණය පහත දැක්වේ;

C	+ L	= A	
හිමිකම්	+ වගකීම්	= වත්කම්	
ප්‍රාග්ධනය 150 000	+ බැංකු ණය 50 000	= මුදල්	145 000
		බඩු තොගය	35 000
		යන්ත්‍ර	20 000
150 000	50 000		200 000

05. මාසික ගොඩනැගිලි කුලිය රු 5 000 මුදලින් ගෙවීම.

මේ නිසා මුදල් වත්කම රු5 000කින් අඩු වී රු 140 000 බවට පත් වේ. ගොඩනැගිලි කුලිය වියදමක් බැවින් ප්‍රාග්ධනයෙන් අඩු වී ප්‍රාග්ධනය රු 145 000 බවට පත්වේ. අනෙකුත් වත්කම්වලත් වගකීම්වලත් වෙනසක් නැත. එවිට සමීකරණය පහත සඳහන් පරිදි වේ;

C	+	L	=	A	
හිමිකම්	+	වගකීම්	=	වත්කම්	
ප්‍රාග්ධනය 145 000	+	බැංකු ණය 50 000	=	මුදල්	140 000
				බඩු තොගය	35 000
				යන්ත්‍ර	20 000
145 000		50 000			195 000

06. බැංකු ණයෙන් කොටසක් පියවීම සඳහා රු 8 000ක් ගෙවීම.

මේ ගනුදෙනුව නිසා මුදල් වත්කම රු 8 000කින් ද බැංකු ණය රු 8 000කින් ද අඩු වේ. අනෙකුත් වත්කම්වලත් ප්‍රාග්ධනයේත් වෙනසක් සිදු නොවේ. සමීකරණය පහත දැක්වෙන පරිදි වෙනස් වේ;

C	+	L	=	A	
හිමිකම්	+	වගකීම්	=	වත්කම්	
ප්‍රාග්ධනය 145 000	+	බැංකු ණය 42 000	=	මුදල්	132 000
				බඩු තොගය	35 000
				යන්ත්‍ර	20 000
145 000		42 000			187 000

07. ගත් මිල (පිරිවැය) රු 15 000 ක් වූ බඩු තොගයක් රු 23 000කට විකුණා මුදල් ලබා ගැනීම.

මේ ගනුදෙනුවේ බලපෑම වන්නේ බඩු තොග වත්කම රු 15 000කින් අඩු වී රු 20 000ක් බවට පත් වීම යි. එසේ ම රු 15 000ක භාණ්ඩ රු 23 000ට විකිණීම නිසා ඇති වූ රු 8 000ක ලාභය, ප්‍රාග්ධනයට එකතු වීම ය. එවිට ප්‍රාග්ධනය රු 153 000ක් බවට පත් වේ. ඒ හැර මුදල් වත්කම රු 23 000කින් වැඩි වී රු 155 000ක් බවට පත් වේ. ගිණුම්කරණ සමීකරණය පහත දැක්වෙන පරිදි වෙනස් වේ;

C		+	L		=	A	
හිමිකම්		+	වගකීම්		=	වත්කම්	
ප්‍රාග්ධනය	153 000	+	බැංකු ණය	42 000	=	මුදල්	155 000
						බඩු තොගය	20 000
						යන්ත්‍ර	20 000
	153 000			42 000			195 000

08. විකිණීම සඳහා රු 25 000ක බඩු තොගයක් සමන්ගෙන් ණයට ගැනීම.

බඩු තොග වත්කම රු 25 000කින් වැඩි වී රු 45 000ක් බවට පත් වේ. ඒ රු 25 000 ගෙවිය යුතු බැවින් ණය හිමියන් ලෙස රු 25 000ක වගකීමක් බිහි වේ. ගිණුම්කරණ සමීකරණයේ අනෙකුත් අයිතම්වලට බලපෑමක් නැත. සමීකරණය පහත දැක්වෙන පරිදි වෙනස් වේ;

C		+	L		=	A	
හිමිකම්		+	වගකීම්		=	වත්කම්	
ප්‍රාග්ධනය	153 000	+	බැංකු ණය	42 000	=	මුදල්	155 000
			ණය හිමියෝ	25 000		බඩු තොගය	45 000
						යන්ත්‍ර	20 000
	153 000			67 000			220 000

09. ගයාන්ට ලැබුණු රු 30 000ක ලොතරැයි දිනුමෙන් රු 25 000ක් ව්‍යාපාරයේ යෙදවීම.

ව්‍යාපාරයේ යෙදවූ රු 25 000ක මුදල, අතිරේක ප්‍රාග්ධනය නිසා ප්‍රාග්ධනය රු 25 000කින් ඉහළ ගොස් රු 178 000ක් බවට පත් වේ. මුදල් වත්කම ද රු 25 000කින් වැඩි වී රු 180 000ක් බවට පත් වේ. සමීකරණය පහත දැක්වේ.

C	+ L	= A	
හිමිකම්	+ වගකීම්	= වත්කම්	
ප්‍රාග්ධනය 178 000	+ බැංකු ණය 42 000	= මුදල්	180 000
	ණය හිමියෝ 25 000	බඩු තොගය	45 000
		යන්ත්‍ර	20 000
178 000	67 000		245 000

10. රු 32 000ක් ගත්මිල (පිරිවැය) බඩු තොගයක් ආසිරිට රු 45 000කට විකිණීම.
මේ නිසා බඩු තොග වත්කම රු 32 000කින් අඩු වී රු 13 000ක් බවට පත්වේ. ඒ සමඟම ණයගැතියෝ නමින් රු 45 000ක වත්කමක් බිහි වේ. රු 13 000ක ලාභය ප්‍රාග්ධනයට එකතු වී රු 191 000ක් බවට පත් වේ. එවිට සමීකරණය පහත සඳහන් පරිදි වේ.

C	+ L	= A	
හිමිකම්	+ වගකීම්	= වත්කම්	
ප්‍රාග්ධනය 191 000	+ බැංකු ණය 42 000	= මුදල්	180 000
	ණය හිමියෝ 25 000	බඩු තොගය	13 000
		යන්ත්‍ර	20 000
		ණය ගැතියෝ	45 000
191 000	67 000		258 000

11. ගයාන්, තම පුද්ගල ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් රු 6 000ක මුදලක් ලබා ගැනීම.
ව්‍යාපාරයේ ඇති මුදල්, භාණ්ඩ ,ස්ථාවර වත්කම් ආදිය හිමිකරු තම පුද්ගල ප්‍රයෝජනය සඳහා ලබා ගැනීම ගැනිලි ලෙස හැඳින්වේ. ගැනිලි නිසා ප්‍රාග්ධනය අඩු වේ. මේ නිසා ප්‍රාග්ධනය රු 6000කින් අඩු වී රු 185 000ක් බවට පත් වේ. මුදල් වත්කම ද රු 6 000කින් අඩු වී රු 174 000ක් බවට පත් වේ. ගිණුම්කරණ සමීකරණය පහත සඳහන් පරිදි වෙනස් වේ.

C		+ L		= A	
හිමිකම්		+ වගකීම්		= වත්කම්	
ප්‍රාග්ධනය	185 000	+ බැංකු ණය	42 000	= මුදල්	174 000
		ණය හිමියෝ	25 000	බඩු තොගය	13 000
				යන්ත්‍ර	20 000
				ණය ගැතියෝ	45 000
	185 000		67 000		252 000

12. යන්ත්‍ර වත්කම්වලින් රු 2 000ක ප්‍රමාණයක් ක්ෂය වීම.
ස්ථාවර වත්කම්වල ක්ෂය වීම, අලාභයකි. එය වියදමක් සේ සලකා ප්‍රාග්ධනයෙන් අඩු කැරේ. එවිට ප්‍රාග්ධනය රු 2 000කින් අඩු වී රු 183 000ක් බවට පත් වේ. යන්ත්‍ර වත්කම ද රු 2 000කින් අඩු වී රු 18 000ක් බවට පත් වේ;

C		+ L		= A	
හිමිකම්		+ වගකීම්		= වත්කම්	
ප්‍රාග්ධනය	183 000	+ බැංකු ණය	42 000	= මුදල්	174 000
		ණය හිමියෝ	25 000	බඩු තොගය	13 000
				යන්ත්‍ර	18 000
				ණය ගැතියෝ	45 000
	183 000		67 000		250 000

13. අමතර ආදායම් රු 3 400ක් මුදලින් ලැබීම.
මේ නිසා මුදල් වත්කම රු 3 400කින් වැඩිවී රු 177 400ක් බවට පත් වේ. මේ ආදායම නිසා ප්‍රාග්ධනය රු 3 400කින් වැඩි වීරු 186 400ක් බවට පත් වේ. ගිණුම්කරණ සමීකරණය පහත දැක්වෙන පරිදි වෙනස් වේ;

C		+ L		= A	
හිමිකම්		+ වගකීම්		= වත්කම්	
ප්‍රාග්ධනය	186 400	+ බැංකු ණය	42 000	= මුදල්	177 400
		ණය හිමියෝ	25 000	බඩු තොගය	13 000
				යන්ත්‍ර	18 000
				ණය ගැතියෝ	45 000
	186 400		67 000		253 400

13 වන අංකය යටතේ වූ ගිණුම්කරණ සමීකරණය පහත දැක්වෙන පරිදි තව දුරටත් පැහැදිලි කළ හැකි ය:

වත්කම්

ස්ථාවර වත්කම්
යන්ත්‍ර 18 000

ජංගම වත්කම්
මුදල් 177 400 + බඩු තොගය 13 000 + ණය ගැතියෝ 45 000

වගකීම්

දිගු කාලීන වගකීම්
බැංකු ණය 42 000

ජංගම වගකීම්
ණය හිමියෝ 25 000

මේ අනුව ,

			=			
හිමිකම්	+ වගකීම්		=	වත්කම්		
ප්‍රාග්ධනය	+ දිගු කාලීන වගකීම්	+ ජංගම වගකීම්	=	ස්ථාවර වත්කම්	+	ජංගම වත්කම්
186 400	+ 42 000	+ 25 000	=	18 000	+	235 400

ගනුදෙනුවක ද්විත්ව බලපෑම

ඕනෑ ම ගනුදෙනුවක ද්විත්ව බලපෑමක් ඇත. ද්විත්ව බලපෑම නිවැරැදි ව හඳුනා ගැනීමෙන් ගිණුම්කරණ කටයුතු මැනවින් කළ හැකි ය. ලෙජර ගිණුම්වලට හර හෝ බැර හෝ ලෙසට පිටපත් කිරීමේ දී ගනුදෙනුවක ද්විත්ව ස්වරූපය නිශ්චිත වශයෙන් හඳුනා ගත යුතු වේ.

ව්‍යාපාරික ගනුදෙනුව	ද්විත්ව බලපෑම
01. ගයාන් රු 150 000ක් යොද ව්‍යාපාරය ආරම්භ කිරීම	රු 150 000ක මුදල් වත්කමක් බිහි වීම රු 150 000ක (ප්‍රාග්ධනය) හිමිකමක් බිහි වීම
02. බැංකුවෙන් රු 50 000ක ණය මුදලක් ලබා ගැනීම	මුදල් වත්කම රු 50 000කින් වැඩි වීම බැංකු ණය ලෙස රු 50 000 ක වගකීමක් ඇති වීම
03. විකිණීම සඳහා රු 35 000ක බඩු තොගයක් මිල දී ගැනීම	මුදල් වත්කම රු 35 000කින් අඩු වීම රු 35 000ක බඩු තොග වත්කමක් ඇති වීම
04. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු 20 000කට යන්ත්‍රයක් මිල දී ගැනීම	මුදල් වත්කම රු 20 000කින් අඩු වීම රු 20 000ක යන්ත්‍ර වත්කමක් බිහි වීම
05. මාසික ගොඩනැගිලි කුලිය රු5 000 මුදලින් ගෙවීම	මුදල් වත්කම රු 5 000කින් අඩු වීම ගොඩනැගිලි කුලී ලෙස රු 5000ක වියදමක් බිහි වීම
06. බැංකු ණය කොටසක් පියවීම සඳහා රු 8 000ක් ගෙවීම	මුදල් වත්කම රු8 000කින් අඩු වීම බැංකු ණය වගකීම රු 8 000කින් අඩු වීම
07. පිරිවැය රු 15 000ක බඩු තොගය රු 23 000කට විකුණා මුදල් ලබා ගැනීම	මුදල් වත්කම රු 23 000කින් වැඩි වීම රු 23 000ක විකුණුම් ආදයමක් බිහි වීම
08. විකිණීම සඳහා රු 25 000ක බඩු තොගයක් සමන්ගෙන් ණයට ගැනීම	බඩු තොග වත්කම රු 25 000කින් වැඩි වීම ණය හිමියන් ලෙස රු 25 000ක වගකීමක් ඇති වීම
09. අමතර (ප්‍රාග්ධනය) ලෙස රු25 000 ක් යෙදවීම	මුදල් වත්කම රු25 000කින් වැඩි වීම ප්‍රාග්ධන හිමිකම රු 25 000කින් වැඩි වීම
10. ගත් මිල (පිරිවැය)රු 30 000ක් බඩු තොගයක් ආසිරිට රු 45 000කට ණයට විකිණීම	රු 45 000ක විකුණුම් ආදයමක් බිහි වීම රු 45 000ක ණය ගැතියන් ලෙස වත්කමක් ඇති වීම

ව්‍යාපාරික ගනුදෙනුව	ද්විත්ව බලපෑම
11. ව්‍යාපාරයේ අයිතිකරු රු 6 000ක මුදලක් පුද්ගල ප්‍රයෝජනය සඳහා ගැනීම	මුදල් වත්කම රු 6 000කින් අඩු වීම ප්‍රාග්ධන හිමිකම රු 6 000කින් අඩු වීම(හෙවත් රු 6 000ක ගැනිලි බිහි වීම)
12. යන්ත්‍රවලින් රු 2 000ක ප්‍රමාණයක් ක්ෂය වීම	යන්ත්‍ර ක්ෂය වීම් ලෙස රු 2 000ක අලාභයක් ඇති වීම යන්ත්‍ර වත්කම රු 2 000කින් අඩු වීම
13. අමතර ආදායම් රු3 400ක් මුදලින් ලැබීම	මුදල් වත්කම රු 3 400කින් වැඩි වීම අමතර ආදායම් ලෙස රු 3 400ක ආදායමක් බිහි වීම

ක්‍රියාකාරකම් 01

පහත සඳහන් වගුවේ දක්වා ඇති එක් එක් ගනුදෙනු නිසා ගිණුම්කරණ සමීකරණයට ඇති වන බලපෑම සඳහන් කරන්න.

ගනුදෙනුව	හිමිකම් +	වගකීම් =	වත්කම්
01. අයිතිකරු රු 40 000ක් යොද රෙදි විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම	ප්‍රාග්ධනය + 40 000		මුදල් + 40 000
02. විකිණීම සඳහා රු 24 000කට රෙදි මිල දී ගැනීම			
03. ගෙන ඒමේ කුලී රු 2 500 ක් ගෙවීම			
04. රු 4 000ක ලී බඩු මිල දී ගැනීම			
05. රු 12 000ක රෙදි රු 18 000ට විකිණීම			
06. බැංකුවෙන් රු 30 000ක මුදලක් ණයට ගැනීම			
07. බැංකු ණය පොළී වශයෙන් රු 1 500ක් ගෙවීම			
08. රු 25 000කට රෙදි තොගයක් ණයට ගැනීම			
09. රු 400ක් ණය හිමියනට ගෙවීම			
10. රු 14 000ක් ගත් මිල වූ රෙදි තොගයක් රු 21 000කට ණයට විකිණීම			



ක්‍රියාකාරකම් 02

ක්‍රියාකාරකම් 1හි දැක්වෙන එක් එක් ගනුදෙනුවේ බලපෑම පහත දැක්වෙන ලේඛනයේ සඳහන් කරන්න. එයට පසු එක් එක් තීරුව පහළට එකතු කරන්න.

ගනුදෙනු අංකය	හිමිකම්	+ වගකීම්		=	වත්කම්	
	ප්‍රාග්ධනය +	බැංකු ණය +	ණය හිමියෝ	මුදල් +	භාණ්ඩ තොග +	ලී බඩු
01	40 000			40 000		
02						
03						
04						
05						
06						
07						
08						
09						
10						

ව්‍යාපාරික ගනුදෙනුවල ද්විත්ව ස්වරූපය නිවැරැදි ව හර හෝ බැර හෝ ලෙසට සටහන් කිරිමට යොදා ගන්නා ආකෘතිය ලෙජර ගිණුම වේ. සාම්ප්‍රදයික ව ගිණුමක ආකෘතිය ඉංග්‍රීසි T අකුරක හැඩය ගන්නා අතර එහි වම් පැත්ත හර ලෙසත් දකුණු පැත්ත බැර ලෙසත් දක්වේ.

හර ලෙජර ගිණුමක ආකෘතිය බැර

දිනය	විස්තරය	ස. පි.	මුදල	දිනය	විස්තරය	ස. පි.	මුදල

මූලික ලෙජර ගිණුම් වර්ග පහකි. ඒ එක් එක් ලෙජර ගිණුමක හර ලෙසත් බැර ලෙසත් සටහන් කැරෙන්නේ ගනුදෙනුවක ද්විත්ව ස්වරූපය යි. ද්විත්ව සටහන් රීති (මූල ධර්ම) එහි දී යොදා ගැනේ. පහත දැක්වෙන සටහනින් එය පැහැදිලි වේ.

ලෙජර ගිණුම් වර්ගය	ද්විත්ව සටහන් න්‍යාය	අදාළ ගිණුම
i. වත්කම්	වත්කම් පිළිබඳ රීතිය (න්‍යාය) 1. වත්කම් වැඩි වීම හර 2. වත්කම් අඩු වීම බැර	හර වත්කම් ගිණුම බැර xx (1) | xx (2)
ii. වගකීම්	වගකීම් පිළිබඳ රීතිය 1. වගකීම් අඩු වීම හර 2. වගකීම් වැඩි වීම බැර	හර වගකීම් ගිණුම බැර xx (1) | xx (2)
iii. හිමිකම් (ප්‍රාග්ධනය)	ප්‍රාග්ධනය (හිමිකම්) පිළිබඳ රීතිය 1. ප්‍රාග්ධනය අඩු වීම හර 2. ප්‍රාග්ධනය වැඩි වීම බැර	හර ප්‍රාග්ධන ගිණුම බැර xx (1) | xx (2)
iv. ආදායම්	ආදායම් පිළිබඳ රීතිය 1. ආදායම් අඩු වීම හර 2. ආදායම් වැඩි වීම බැර	හර ආදායම් ගිණුම බැර xx (1) | xx (2)
v. වියදම්	වියදම් පිළිබඳ රීතිය 1. වියදම් වැඩි වීම හර 2. වියදම් අඩු වීම බැර	හර වියදම් ගිණුම බැර xx (1) | xx (2)

ද්විත්ව සටහන් රීති වලට (මූලධර්මවලට) අනුව ව්‍යාපාර ගනුදෙනු කීපයක් විශ්ලේෂණය කරන ආකාරයත් ඒවා ගිණුම්ගත කරන ආකාරයත් සලකා බලමු.

නිදසුන්

1. 20080101 ගයාන් රු 150 000ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම
2. 20080102 විකිණීම සඳහා රු 80 000ක භාණ්ඩ මිල දී ගැනීම
3. 20080105 රු 60 000ක බැංකු ණයක් ගැනීම
4. 20080108 අත්පිට විකුණුම් රු 34 000
5. 20080110 බැංකු ණය ආපසු ගෙවීම් රු 4 000
6. 20080112 ගොඩනැගිලි කුලී රු 6 000 ගෙවීම

නොමිලේ බෙදා හැරීම පිණිසයි

ගනුදෙනු විශ්ලේෂණය

ගනුදෙනුව	ගනුදෙනු විශ්ලේෂණය	ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන් න්‍යාය
1. රු 150 000කින් ව්‍යාපාරය ආරම්භ කිරීම	මුදල් වත්කම වැඩි වීම ප්‍රාග්ධන (හිමිකම) වැඩි වීම	මුදල් ගිණුම හර ප්‍රාග්ධන ගිණුම බැර
2.රු 80 000ක භාණ්ඩ විකිණීම සඳහා ගැනීම	භාණ්ඩ තොග වත්කම වැඩි වීම මුදල් වත්කම අඩු වීම	භාණ්ඩ තොග (ගැනුම) ගිණුම හර මුදල් ගිණුම බැර
3.රු 60 000ක බැංකු ණයක් ගැනීම	මුදල් වත්කම වැඩි වීම බැංකු ණය වගකීම වැඩි වීම	මුදල් ගිණුම හර බැංකු ණය ගිණුම බැර
4.අත්පිට විකුණුම් රු 34 000	මුදල් වත්කම වැඩි වීම විකුණුම් ආදායම වැඩි වීම	මුදල් ගිණුම හර විකුණුම් ගිණුම බැර
5.බැංකු ණය ආපසු ගෙවීම 4 000	බැංකු ණය වගකීම අඩු වීම මුදල් වත්කම අඩු වීම	බැංකු ණය ගිණුම හර මුදල් ගිණුම බැර
6.ගොඩනැගිලි කුලී රු 6 000 ගෙවීම	ගොඩනැගිලි කුලී වියදම වැඩි වීම මුදල් වත්කම අඩු වීම	ගොඩනැගිලි කුලී ගිණුම හර මුදල් ගිණුම බැර

හර මුදල් ගිණුම බැර

දිනය	විස්තරය	ස.පි.	මුදල රු	දිනය	විස්තරය	ස.පි.	මුදල රු
2008				2008			
1 1	ප්‍රාග්ධනය		150 000	1 2	ගැනුම්(භාණ්ඩ තොග)		80 000
1 5	බැංකු ණය		60 000	1 10	බැංකු ණය		4 000
1 8	විකුණුම්		34 000	1 12	ගොඩනැගිලි කුලී		6 000

හර ප්‍රාග්ධන ගිණුම බැර

දිනය	විස්තරය	ස.පි.	මුදල රු	දිනය	විස්තරය	ස.පි.	මුදල රු
				2008			
				1 1	මුදල්		150 000

නොමිලේ බෙදා හැරීම පිණිසයි

හර ගැනුම්(භාණ්ඩ තොග) ගිණුම බැර

දිනය	විස්තරය	ස.පි.	මුදල රු	දිනය	විස්තරය	ස.පි.	මුදල රු
2008 1 2	මුදල්		80 000				

හර බැංකු ණය ගිණුම බැර

දිනය	විස්තරය	ස.පි.	මුදල රු	දිනය	විස්තරය	ස.පි.	මුදල රු
2008 01 10	මුදල්		4 000	2008 1 5	මුදල්		60 000

හර විකුණුම් ගිණුම බැර

දිනය	විස්තරය	ස.පි.	මුදල රු	දිනය	විස්තරය	ස.පි.	මුදල රු
				2008 1 8	මුදල්		34 000

හර ගොඩනැගිලි කුලී ගිණුම බැර

දිනය	විස්තරය	ස.පි.	මුදල රු	දිනය	විස්තරය	ස.පි.	මුදල රු
2008 1 12	මුදල්		6 000				

ආදායම් ප්‍රකාශය

ගිණුම් කාලච්ඡේදය තුළ ඉපැයූ ලාභය හෝ අලාභය හෝ ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන මූල්‍ය වාර්තාවක් ලෙස ආදායම් ප්‍රකාශය හැඳින්විය හැකි ය.

ව්‍යාපාරයක කාර්ය සාධනය මැනීම සඳහා ලාභය (මෙහෙයුම් ප්‍රතිඵලය) විවිධ අවස්ථාවල දී උපයෝගි කර ගැනේ. ආදායම් ප්‍රකාශයක මූලිකාංග

ආදායම්

වියදම් වේ.

මේ එකිනෙක ලුහුඬින් පැහැදිලි කරමු.

ආදායම්

ආදායම් යනු ගිණුම් කාලච්ඡේදය තුළ දී ව්‍යාපාරයට ප්‍රතිලාභ ගලා ඒමටත් අයිතිකරුවන්ගේ හිමිකම් ඉහළ යාමටත් හේතු වන ආර්ථික ප්‍රතිලාභ වේ.

විකුණුම්, ආයෝජන ආදායම්, පොළී ලැබීම්, ස්ථාවර වත්කම්, විකුණුම් ලාභ යන මේවා නිදසුන් වේ. මෙකී ආදායම් අයභාර ආදායම් ලෙස වෙන ම හඳුනා ගැනේ.

වියදම්

වියදම් යනු ගිණුම් කාල පරිච්ඡේදය තුළ ආදායම් බිහි කර ලීමට දායක වන පිරිවැය කොටස ය.

ව්‍යාපාරයෙන් පිටතට ගලා යාමක් හෝ වත්කම්වල ක්ෂය වීමක් හෝ ලෙස අයිතිකරුවන්ගේ හිමිකම අඩු වීමට හේතු වන ප්‍රතිලාභවල අඩු වීම් වේ. විකුණුම් පිරිවැය පරිපාලන වියදම්, බෙදා හැරීමේ වියදම්, වත්කම්වල ක්ෂය වීම් යන මේවා නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

ගිණුම්කරණ සමීකරණයේ අයිතමවලට බලපෑම් ඇති කරන ව්‍යාපාරික ගනුදෙනුවලින් ආදායම් ප්‍රකාශයක් පිළියෙල කරන ආකාරය පැහැදිලි කර ගනිමු.

නිදසුන

1. පිරිවැය (ගත් මිල)රු 45 000ක් වූ බඩු තොගයක් රු 63 000කට විකිණීම
2. ප්‍රචාරණ වියදම රු 8 000 ගෙවීම
3. මාසික විදුලි ගාස්තු රු 3 000ක් ගෙවීමට ඇත.
4. රු 30 000ක යන්ත්‍ර උපකරණවලින් 10%ක ප්‍රමාණයක් වාර්ෂික ව ක්ෂය කැරේ.

5. 10%ක වාර්ෂික පොළී ලැබෙන ස්ථාවර තැන්පතුව රු 60 000ක් වේ.
6. වෙළෙඳ සේවක මාසික වැටුප් රු 9 000 වුවත් මුදලින් ගෙවා ඇත්තේ රු 6 000ක් පමණි.
7. ව්‍යාපාරයේ ගොඩනැගිල්ලෙන් කොටසක් කුලියට දී ඇත. එයින් මාසික ව රු 4 500 ක් කුලී වශයෙන් ලැබේ.
8. රු 42 000ක් වූ ණය ගැතියන්ගෙන් රු 2 000ක් බොල් ණය ලෙස පොත්වලින් කපා හළ යුතු ය.

ගිණුම් කාලය 2008 ජනවාරි මාසය යැයි උපකල්පනය කරමින් විමුක්ති වෙළෙඳ සලේ ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

විමුක්ති වෙළෙඳ සල
2008 ජනවාරි 31න් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශය

	රු	රු
ආදායම්		
විකුණුම්	63 000	
පොළී ආදායම්	500	
ගොඩනැගිලි කුලී ආදායම්	4 500	
		68 000
වියදම්		
විකුණුම් පිරිවැය	45 000	
ප්‍රචාරණ වියදම්	8 000	
විදුලි ගාස්තු	3 000	
යන්ත්‍ර ක්ෂය වීම	250	
වෙළෙඳ සේවක වේතන	9 000	
බොල් ණය	2 000	
		67 250
ශුද්ධ ආදායම / ශුද්ධ ලාභය		750

ක්‍රියාකාරකම් 03

පහත දැක්වෙන තොරතුරුවලින් "පිවිතුරු" ව්‍යාපාරයේ 2008 ජනවාරි මාසය සඳහා ආදයම් ප්‍රකාශය පිළියෙල කරන්න.

- ගත් මිල (පිරිවැය) රු 24 000ක් වූ බඩු තොගයක් රු 36 000කට විකිණීම
- වරිපනම් රු 1 800
- මාසික විදුලි බිල රු 4 500
- 10% වාර්ෂික ආයෝජනවල වටිනාකම රු 75 000
- පිරිවැය රු 30 000ක් වූ බඩු තොගයක් රු 48 000කට ණයට විකිණීම
- රු 20 000ක ලී බඩුවලින් වාර්ෂික ක්ෂය වෙන් කිරීම 12%
- වාර්ෂික රක්ෂණ ගාස්තුව රු 12 000
- විවිධ ආදයම්වලින් ලැබී ඇති මුදල රු 6 500.

ශේෂ පත්‍රය

නිශ්චිත දිනකට ව්‍යාපාරයක පවතින වත්කම්, හිමිකම්, වගකීම්, (මූල්‍ය තත්ත්වය) යන මේවා දැක්වෙන ප්‍රකාශය, ශේෂ පත්‍රය වේ.

මූල්‍ය ආයතනවලින් (නිදසුන් වශයෙන් බැංකුවකින්) ණය පහසුකම් ලබා ගැනීමේ දී ශේෂ පත්‍රය විශේෂයෙන් ම වැදගත් වේ.

ආදයම් ප්‍රකාශයෙන් ගණනය කැරෙන ශුද්ධ ලාභය ප්‍රාග්ධනයට එකතු කැරේ. ශුද්ධ අලාභයක් නම් ප්‍රාග්ධනයෙන් අඩු කැරේ.

ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය අනාවරණය කැරෙන ශේෂ පත්‍රයක මූලිකාංග තුනක් දක්නට ඇත. ඒවා,

වත්කම්
හිමිකම්
වගකීම් වේ.

පහත සඳහන් තොරතුරු පදනම් කර ගනිමින් 2008 ජනවාරි 31 දිනට "විමුක්ති"වෙළෙඳ සලේ ශේෂ පත්‍රය පිළියෙල කරමු.

ප්‍රාග්ධනය	270 000
ශුද්ධ ලාභය	180 000
යන්ත්‍ර හා උපකරණ	150 000
රථ වාහන	450 000
ඉතුරු බඩු තොගය	160 000
වෙළෙඳ ණය ගැතියෝ	50 000
අත ඉතිරි මුදල්	145 000
අවුරුදු 5කින් ගෙවිය යුතු බැංකු ණය	200 000
අවුරුදු 3කින් ගෙවිය යුතු උකස් ණය	130 000
වෙළෙඳ ණය හිමියෝ	125 000
ගෙවිය යුතු වියදම්	30 000
බැංකු අයිරාව	20 000

විමුක්ති වෙළෙඳ සල
20080131 දිනට ශේෂ පත්‍රය

	රු	රු		රු	රු
ප්‍රාග්ධනය		270 000	ජංගම නොවන වත්කම්		
එකතු කළා			යන්ත්‍ර උපකරණ	150 000	
ශුද්ධ ලාභය		180 000	රථ වාහන	450 000	600 000
		450 000	ජංගම වත්කම්		
ජංගම නොවන වගකීම්			ඉතුරු තොගය	160 000	
බැංකු ණය	200 000		ණය ගැතියෝ	50 000	
උකස් ණය	130 000	330 000	මුදල්	145 000	355 000
ජංගම වගකීම්					
ණය හිමියෝ	125 000				
ගෙවිය යුතු වියදම්	30 000				
බැංකු අයිරාව	20 000	175 000			
		955 000			955 000

ශේෂ පත්‍ර සිරස් ආකෘතිය අනුව ද පිළියෙල කැරේ. ඒ අනුව ඉහත තොරතුරු ම පහත දැක්වෙන සිරස් ආකෘතිය මගින් ඉදිරිපත් කැරේ.

විමුක්ති වෙළෙඳ සල
2008 ජනවාරි 31 දිනට ශේෂ පත්‍රය

	රු	රු
ජංගම නොවන වත්කම්		
යන්ත්‍ර උපකරණ	150 000	
රථ වාහන	450 000	600 000
ජංගම වත්කම්		
ඉතුරු බඩු තොගය	160 000	
ණය ගැතියෝ	50 000	
මුදල්	145 000	355 000
		955 000
මුළු වත්කම්		
ප්‍රාග්ධනය	270 000	
එකතු කළා: ශුද්ධ ලාභය	180 000	450 000
ජංගම නොවන වගකීම්		
බැංකු ණය	200 000	
උකස් ණය	130 000	330 000
ජංගම වගකීම්		
ණය හිමියෝ	125 000	
ගෙවිය යුතු වියදම්	30 000	
බැංකු අයිරාව	20 000	175 000
හිමිකම් හා වගකීම්වල එකතුව		955 000

ක්‍රියාකාරකම් 04

ශාලිකා ව්‍යාපාර ආයතනයේ පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත. 20080101 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

	(රු. දහස් වලින්)
ඉඩම් හා ගොඩනැගිලි	6 000
12% බැංකු ණය	3 200
අත ඉතුරු මුදල්	900
ණය ගැතියෝ	750

	(රු. දහස් වලින්)
ණය හිමියෝ	2 400
රථ වාහන	8 500
ඉදිරියට කළ ගෙවීම්	200
ගෙවිය යුතු වියදම්	300
ප්‍රාග්ධනය	9 350
ශුද්ධ ලාභය	2 500
ඉතුරු බඩු තොගය	1 400

ගනුදෙනු වාර්තා කැරෙන මූලික පොත් හා මූලාශ්‍ර ලේඛන

ව්‍යාපාරයක සිදු වන මුදලින් මැනිය හැකි ගනුදෙනු, මුදල් මාධ්‍යයෙන් වාර්තා කැරේ. පහත දැක්වෙන ආකාරයට ගනුදෙනු වර්ග කැරේ;



මුදලින් සිදු වන ගනුදෙනු, අත්පිට ගනුදෙනු ලෙස ද හැඳින්වේ.

නිදසුන් සේවක වැටුප් රු 8 000ක් ගෙවීම. රු 15 000කට භාණ්ඩ මිල දී ගැනීම

ණයට ගනුදෙනු සිදු වන විට ඒ ගනුදෙනුව ඇති වූ අවස්ථාවේ දී ම මුදල් හුවමාරුවක් නො කැරේ.

නිදසුන් රු 20 000ක භාණ්ඩ ශාලිකා වෙළෙඳ සලෙන් ගැනීම
සුරේකාට රු 45 000කට භාණ්ඩ විකිණීම

ණයට ගනුදෙනු සිදු වන විට ගනුදෙනුකරුගේ නම සඳහන් කිරීම, වැදගත් සේ සැලකිය යුතු ය.
ගනුදෙනුවක් සටහන් කිරීම ආරම්භ වන්නේ මූලාශ්‍ර ලේඛනවලිනි.

මූලාශ්‍ර ලේඛන යනු ගනුදෙනුවලට අදල පාර්ශ්වයන් ද මූල්‍ය වටිනාකම් ද කොන්දේසි ද අවශ්‍ය අනෙකුත් තොරතුරු ද සටහන් කර ඇති ලියවිල්ල යි.

ඒවා ගනුදෙනුව සිදු වූ බව සනාථ කැරෙන ලිඛිත සාක්ෂි වේ.

නිදසුන ගෙවුම් වවුචරය, ව්‍යාපාරයෙන් මුදල් ගෙවූ බවට සාක්ෂියක් වේ. ලදු පත, ව්‍යාපාරයට මුදල් ලැබුණු බවට සාක්ෂියකි. ගැනුම් ඉන්වොයිසිය, ණයට ගැනුම් සිදු වූ බවට සාක්ෂියකි.

මූලාශ්‍ර ලේඛනවලින් ලැබෙන ප්‍රයෝජන

- ගනුදෙනුව සිදු වූ බව සනාථ කැරෙන ලිඛිත සාක්ෂියක් වීම
- ගනුදෙනුවට අදළ ආරම්භක ලියවිල්ල ලෙස යොද ගත හැකි වීම
- අත්සන් කරන පාර්ශ්වයක් සිටීම නිසා, වගකීම නිශ්චිත ව ම පැවරිය හැකි වීම
- සිදු වූ ගනුදෙනුවට අදළ තොරතුරු විස්තරාත්මක ව සඳහන් වීම
- ගනුදෙනු පොත්වල සටහන් කිරීමේ දී පදනමක් ලෙස භාවිතයට ගත හැකි වීම.

ගනුදෙනු වාර්තා කිරිමේ දී යොද ගැනෙන මූලාශ්‍ර ලේඛන කීපයක් මී ළඟට සලකා බලමු .

ඉන්වොයිසිය

විකුණුම්කරු (සැපයුම්කරු) ගැනුම්කරු වෙත යවන භාණ්ඩ පිළිබඳ ගනුදෙනුවට අදළ කරුණු ඇතුළත් කර සකස් කරන ලියවිල්ල යි.

මෙය, භාණ්ඩ මිලට ගන්නා පාර්ශ්වය පැත්තෙන් බලන විට ගැනුම් ඉන්වොයිසිය වේ. විකුණුම්කරුගේ පාර්ශ්වයෙන් බලන විට විකුණුම් ඉන්වොයිසිය වේ.

නිදසුන ගයාන් වෙළෙඳ සැලේ ඇණවුම පරිදි සී/ස ශාලිකා සමාගම විසින් පිළියෙල කැරුනු ඉන්වොයිසිය පහත දැක්වේ.

ඉන්වොයිසිය
සීමාසහිත ශාලිකා සමාගම
අංක 1222, කෙළින් වීදිය,
නාඹටුන්න.
දුරකථන ඃ 4868223

අංකය ඃ 1322
දිනය ඃ 01012008

කළමනාකරු,.....
ගයාන් පොත් හල ,
කෙළින් වීදිය,......
වලස්ගල............

ඔබගේ අංක ......A / 425 හා....2007 - 12-15............ දින දරන ඇණවුම අනුව ය.

අනු අංකය	විස්තරය	ප්‍රමාණය	ඒකකයක මිල රු	වටිනාකම රු
	චිත්‍ර පොත්	25	45.00	1 125.00
	CRපොත්	130	30.00	3 900.00
	ළමා කවි පොත්	40	50.00	2 000.00
	බාග කඩදාසි	පැ 10	250.00	2 500.00
	රෝනියෝ කඩදසි	පැ 10	200.00	2 000.00
	ඡායා පිටපත්	පැ 30	325.00	9 750.00
				21 275.00
	අඩු කළා 10% වට්ටම්			2 127.50
				19 147.50

(සියලු ම චෙක්පත් සීමාසහිත ශාලිකා සමාගම නමට ලියා රේඛනය කළ යුතු ය.)

....
කළමනාකරු

විකුණුම් කොන්දේසි 5/30 ශුද්ධ 60
ඌ.අ.දෝ.හැ.

ඌ.අ.දෝ.හැ.වලින් දැක්වෙන්නේ ඌනතා අතිරික්තතා දෝෂ හැර යන්න යි. ඉන්වොයිසිය පිළියෙල කිරීමේ දී යම් වැඩි වීමක් හෝ අඩු වීමක් හෝ සිදු වී තිබේ නම්, එය නිවැරැදි කිරීමට විකුණුම්කරු සූදනම් බව මෙහි අදහස යි.

මුදල් ගෙවීමේ කොන්දේසි දක්වා ඇත්තේ 5/30 ශුද්ධ 60 යනුවෙනි. එහි අදහස , මුළු මුදල දින 60ක් ඇතුළත ගෙවිය යුතු බවත් දින 30කට පෙර ගෙවන්නේ නම්, 5%ක වට්ටමක් අඩු කරන බවත් ය.

ලදු පත

වයාපාර ආයතනයකට මුදල් ලැබුණු බව සනාථ කරමින් එහි වගකිව යුතු පුද්ගලයකු තම අත්සන යොද නිකුත් කරන මූලික ලියවිල්ලයි.

මුදල් මැමය, මුදල් ලැබීමේ කුවිතාන්සිය මුදල් ලැබීමේ රිසිට් පත යන ආදි නම් වලින් හැඳින්වෙන්නේත් මේ ලදු පත ම ය.

ලදු පතක ආකෘතිය ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට වෙනස් විය හැකි වුව ද, ඒවායේ පොදු ලක්ෂණ කිහිපයක් දක්නට ලැබේ. වෙළෙඳ ආයතනයක් නිකුත් කර ඇති ලදු පතක් නිදසුනක් වශයෙන් පහත දක්වා ඇත.

ලදු පත

අනෝමා පොත්හල
82, අරලිය පාර,
නාඔටුන්න
දුරකථනය 2030278
දිනය ....

අංකය ඃ 20513

.... ට සැපයූ
අංක...................... දරන ඉන්වොයිසිය සඳහා ලැබිය යුතු රු .... මුදල ....
චෙක්පතින් / මුදලින් ස්තුතියෙන් භාර ගතිමි.

රු ....

මුද්දර මත
අත්සන

ගෙවුම් වවුචරය

ව්‍යාපාර ආයතනයක් මුදල් ගෙවීමේ දී භාවිත කරන මූලාශ්‍ර ලේඛනය ගෙවුම් වවුචරය වේ.

ගෙවීම් බොහෝ විට කැරෙන්නේ වලංගු මුදලින් නැත හොත් චෙක්පත්වලිනි. සේවක වැටුප්, විදුලි ගාස්තු ,ණය හිමි ගෙවීම් ආදිය සඳහා ගෙවුම් වවුචරය සාමාන්‍යයෙන් පිළියෙල කැරේ.

ගෙවීම් වවුචරයක ආකෘතියක් පහත දැක්වෙන අතර එය නිරීක්ෂණය කරන්න.

සීමාසහිත ශාලිකා සමාගම
ගෙවුම් වවුචරය

රු..................................... දිනය ....
රුපියල් ....
....
.... වෙත
ගෙවන ලදි.

විස්තරය ....
....
....
....
....

වවුචර අංකය ....
චෙක්පත් අංකය ....
මුදල රු..
ගෙවූ දිනය ....
අනුමත කළේ ....
ගිණුම ....

ඉන්වොයිසි අංකය : .... බිල් අංකය : .... ලදු පත් අංකය:.................

ක්‍රියාකාරකම් 05

පහත සඳහන් දත්ත යොදා ගනිමින් ගෙවුම් වවුචර ආකෘතියක් පිළියෙල කරන්න.

දිනය	20080104
මුදල	රු 4580.75
මුදල් ගෙවීමට අදාළ විස්තරය	2007 දෙසැම්බර් මාසයේ විදුලි ගාස්තුව
මුදල් ගෙවිය යුතු ලිපිනය	දේශීය විදුලි බල සමාගම අංක 435 ගාල්ල
විදුලි බිල්පත් අංකය	2875
චෙක්පත් අංකය	0004441092
ගිණුම් අංකය (මුදල් යැවිය යුතු)	4792524925
ව්‍යාපාර ආයතනය	සීමාසහිත ශාලිකා සමාගම

මූලික පොත්

මූලික පොත් යනු ව්‍යාපාරික ගනුදෙනු තුළින් බිහිවන මූලාශ්‍ර ලේඛනවල පවතින තොරතුරු, කාලය අනු පිළිවෙළට වාර්තා කරන පොත් වේ.

මූලික පොත් රාශියක් ඇතත් අප මෙහි දී අවධානය යොමු කරන්නේ පහත සඳහන් මූලික පොත් කෙරෙහි පමණි:

- මුදල් පොත
- විකුණුම් පොත
- ගැනුම් පොත.

මුදල් පොත

ආයතනයකට ලැබෙන මුදල් ද ආයතනයෙන් ගෙවන මුදල් ද සටහන් කිරීමට භාවිත කරන මූලික පොත, මුදල් පොත වේ.

මුදල් ගනුදෙනුවලට සම්බන්ධ ලදු පත්, ගෙවුම් වවුචර ආදි මූලාශ්‍ර ලේඛන පදනම් කර ගනිමින් මුදල් පොත සකස් කරනු ලැබේ.

ව්‍යවහාර මුදලින් (නෝට්ටු හා කාසි) වන ලැබීම් ද ව්‍යවහාර මුදලින් කැරෙන ගෙවීම් ද මෙහි සටහන් කැරේ. මුදල් ලැබීම් සටහන් කිරීමට මුදල් පොතේ හර තීරුව ද මුදල් ගෙවීම් සටහන් කිරීමට බැර තීරුව ද යොදා ගැනේ. මුදල්, වත්කම් ගිණුම් වර්ගයට අයත් නිසා ව්‍යාපාරයට මුදල් ලැබෙන විට වත්කම් වැඩි වීමක් සිදු වේ. ව්‍යාපාරයෙන් මුදල් වැය වන විට වත්කම් අඩු වීමක් සිදු වේ. වත්කම් පිළිබඳ මූලධර්මය අනුව මුදල් පොතේ සටහන් ඇතුළත් කිරීම මේ අනුව සිදු වේ.

සාමාන්‍යයෙන් භාවිත වන ඉංග්‍රීසි T අකුරේ හැඩයෙන් යුත් තනි තීරු මුදල් පොතක ආකෘතිය, පහත දක්වේ:

හර මුදල් පොත බැර

දිනය	ලදු පත් අංකය	විස්තරය	ස. පි.	මුදල රු.	දිනය	වවුචර අංකය	විස්තරය	ස. පි.	මුදල රු.

මුදල් පොතක හර පැත්තේ වාර්තා කැරෙන ගනුදෙනු	මුදල් පොතේ බැර පැත්තේ වාර්තා කැරෙන ගනුදෙනු
ප්‍රාග්ධනය මුදලින් යෙදවීම	පෞද්ගලික ප්‍රයෝජනය සඳහා මුදල් ආපසු ලබා ගැනීම්
අත්පිට විකුණුම්	අත්පිට ගැනුම්
ණය ගැති ලැබීම්	ණය හිමි ගෙවීම්
බැංකු ණය ගැනීම්	බැංකු ණය ආපසු ගෙවීම්
යන්ත්‍ර, ලී බඩු ආදි ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල්	යන්ත්‍ර, ලී බඩු, ආදි ස්ථාවර වත්කම් මිල දී ගැනීමට ගෙවන මුදල්
ආයෝජන ආදායම්, පොළී ලැබීම්.	රක්ෂණ ගාස්තු, වැටුප් ආදි වියදම් සඳහා මුදල් ගෙවීම්.

පහත සඳහන් ගනුදෙනු ඇසුරින් මුදල් පොත පිළියෙල කරන ආකාරයත් 20080131 දිනට මුදල් ශේෂය ගණනය කරන ආකාරයත් මී ළඟට සලකා බලමු.

දිනය	ලදුපත් අංකය	වවුචර අංකය	විස්තරය
200811			ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා 120 000ක මුදලක් යෙදවීම
0102		001	ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු 15 000ක ලී බඩු මිල දී ගැනීම
0103		002	විකිණීම සඳහා රු 65 000ක භාණ්ඩ තොගයක් ගැනීම
0104		003	ගෙන ඒමේ කුලී රු 2 000ක් ගෙවීම
0105			බැංකුවෙන් රු 50 000ක ණය මුදලක් ලබා ගැනීම
0106	001		අත්පිට විකුණුම් රු 35 000
0107	002		ණය ගැතියන්ගෙන් රු 12 000ක මුදලක් ලැබීම
0108		004	බැංකු ණය සඳහා රු 2 500ක මුදලක් ගෙවීම
0110	003		අත්පිට විකුණුම් රු 16 000
0118		005	සේවක වේතන රු 8 000ක් ගෙවීම
0123			ණය ගැති ලැබීම් රු 24 000
0130		006	විකිණීම සඳහා රු 18 000ක භාණ්ඩ තොගයක් මිල දී ගැනීම
0131		007	අයිතිකරු රු 4 000ක මුදලක් පුද්ගල ප්‍රයෝජනය සඳහා ලබා ගැනීම
0131	005		විවිධ ආදායම් ලෙස රු 13 000ක් ලැබීම.

මුදල් පොත

දිනය	ලදුපත් අංකය	විස්තරය	ස පි	මුදල රු	දිනය	වවුචර් අංකය	විස්තරය	ස පි	මුදල රු
2008									
0101		ප්‍රාග්ධනය		120 000	0102	001	ලී බඩු		15 000
0105		බැංකු ණය		50 000	0103	002	ගැනුම් (භාණ්ඩ තොග)		65 000
0106	001	විකුණුම්		35 000	0104	003	ගෙන ඒමේ කුලී		2 000
0107	002	ණය ගැතියෝ		12 000	0108	004	බැංකු ණය		2 500
0110	003	විකුණුම්		16 000	0118	005	වේතන		8 000
0123	004	ණය ගැතියෝ		24 000	0130	006	ගැනුම් (භාණ්ඩ තොග)		18 000
0131	005	විවිධ ආදායම්		13 000	0131	007	ගැනිලි		4 000
					0131		ශේෂය ප/ගෙ		155 500
				270 000					270 000
0201		ශේෂය ඉ/ගෙ		155 500					

ක්‍රියාකාරකම් 06

පහත සඳහන් තොරතුරුවලින් 2008 ජනවාරි 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා ශාලිකා ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කර 20080131 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

ජනවාරි

01 ශාලිකා යෙදූ ප්‍රාග්ධනය රු 185 000
02 විකිණීම සඳහා භාණ්ඩ මිල දී ගත්තා රු 65 000 (ගෙවුම් වවුචරය 002)
03 ගෙන ඒමේ කුලී රු 2 500 (ගෙවුම් වවුචරය 003)
05 අත්පිට විකුණුම් රු 28 000 (ලදු පත් අංකය 001)
06 ණය ගැති ලැබීම් රු 12 500 (ලදු පත් අංකය 002)
08 බැංකු ණය ගැනීම් රු 40 000
12 ගෙවල් කුලී ගෙවීම් 6 000 (ගෙවුම් වවුචරය 004)
15 පෞද්ගලික ප්‍රයෝජනයට මුදල් ගත්තා රු 5 000 (ගෙවුම් වවුචරය 005)
18 ව්‍යාපාරයේ ප්‍රයෝජනයට යන්ත්‍රයක් ගත්තා රු 20 000 (ගෙවුම් වවුචරය 006)
20 අත්පිට විකුණුම් රු 30 000 (ලදු පත් අංක 003)
22 බැංකු ණය ආපසු ගෙවීම් රු 4 000 (ගෙවුම් වවුචරය 007)
24 ආයෝජන ආදායම් ලැබීම් රු 8 000 (ලදු පත් අංකය 004)
25 ලී බඩු විකිණීමෙන් මුදල් ලැබුණා රු 3 000 (ලදු පත් අංකය 005)
27 ණය හිමි ගෙවීම් රු 17 000 (ගෙවුම් වවුචරය 008)
29 සේවක වේතන ගෙවීම් රු 6 000 (ගෙවුම් වවුචරය 009)

ගැනුම් පොත

වයාපාරයක් නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට ලබා ගන්නා භාණ්ඩ පිළිබඳ තොරතුරු සටහන් කැරෙන මූලික පොත, ගැනුම් පොත හෙවත් ගැනුම් ජ'නලය වේ.

සැපයුම්කරුවන්ගෙන් ලැබෙන ඉන්වොයිසි (ගැනුම් ඉන්වොයිසි) පදනම් කර ගනිමින් ගැනුම් ජ'නලයක් පිළියෙල කැරේ.

පහත සඳහන් ආකෘතිය යොදා ගනිමින් ගැනුම් ජ'නලය පිළියෙල කිරීම කළ හැකි වේ:

ගැනුම් ජ'නලයක ආකෘතිය

දිනය	ඉන්වොයිසි අංකය	සැපයුම් කරු	භාණ්ඩ පිළිබඳ විස්තර			වට්නාකම	මුළු වට්නාකම	ලෙජර පිටු අංකය
			විස්තරය	ප්‍රමාණය	ඒකක මිල			
(1)	(2)	(3)	(4)	(5)	(6)	(7)	(8)	(9)

01. දිනය තීරුව	ඉන්වොයිසියේ සඳහන් දිනය ඇතුළත් කැරේ.
02. ඉන්වොයිසි අංකය	සැපයුම්කරුවන්ගෙන් ලැබෙන ඉන්වොයිසියේ සඳහන් මුද්‍රිත අංකය ඇතුළත් කැරේ.
03. සැපයුම්කරු	භාණ්ඩ ණයට සපයන පුද්ගලයා හෝ ආයතනයේ හෝ නම
04. විස්තරය	මිලට ගත් භාණ්ඩයේ නම
05. ප්‍රමාණය	මිලට ගත් භාණ්ඩ ප්‍රමාණය
06. ඒකක මිල	මිලට ගත් භාණ්ඩ ඒකකයක මිල
07. වට්නාකම	ඉන්වොයිසියේ දැක්වෙන වට්නාකම වේ. වෙළෙඳ වට්ටමක් අඩු කළේ නම්, ඒ ප්‍රමාණය මෙහි සඳහන් කළ යුතු ය.
08. මුළු වට්නාකම්	එක් එක් ඉන්වොයිසියේ දැක්වෙන වට්නාකමින් වෙළෙඳ වට්ටම අඩු කළ පසු ලැබෙන ශුද්ධ වට්නාකම දැක්විය යුතු ය.
09. ලෙජර පිටු අංකය	සැපයුම්කරුගේ ගිණුම දැක්වෙන ලෙජර පිටු අංකයයි.

ගැනුම් ජ'නලයේ එකතුව, ගැනුම් ගිණුමට හර කැරේ. ඒ ඒ ඉන්වොයිසි දිනට අදළ ශුද්ධ විටිනාකම සැපයුම්කරුවන්ගේ (ණය හිමියන්ගේ) ගිණුම්වලට බැර කැරේ. එවිට ද්විත්ව සටහන සම්පූර්ණ වේ.

ගැනුම් පොතක් (ගැනුම් ජ'නලයක්) පිළියෙල කරන ආකාරය නිදසුනක් ඇසුරෙන් සලකා බලමු.

නිදසුන චිත්‍රා රෙදිපිළි මිලට ගෙන විකුණයි. 2008 ජනවාරි මාසයට අදළ තොරතුරු පහත දැක්වේ:

දිනය	ඉන්වොයිසි අංකය	සැපයුම්කරු	මිලට ගත් භාණ්ඩ පිළිබඳ විස්තරය
200815	152	රම්‍යා	එකක් රු 450 බැගින් වූ මසා නිම කළ කමිස 60 එකක් රු 800 බැගින් වූ මසා නිම කළ කලිසම් 120 (අඩු කළ වෙළෙඳ වට්ටම 5%)
2008112	214	සුරම්‍යා	මීටරයක් රු 50 බැගින් චීත්ත රෙදි මීටර 500 මීටරයක් රු 60 බැගින් පොප්ලින් රෙදි මීටර 200 මීටරයක් රු 40 බැගින් සුදු රෙදි මීටර 200 (අඩු කළ වෙළෙඳ වට්ටම 8%)
2008125	316	ශුභ	එකක් රු 1 500 බැගින් ජපන් සාරි 40 එකක් රු 1 200 බැගින් ඉන්දියන් සාරි 60
2008130	165	රම්‍යා	එකක් රු 150 බැගින් ඇඳ ඇතිරිලි 50 එකක් රු 125 බැගින් තුවා 40

ගැනුම් ජ'නලය

දිනය	ඉන්වොයිසි අංකය	සැපයුම් කරු	භාණ්ඩ පිළිබඳ විස්තර			වටිනාකම	මුළු වටිනාකම	ලෙජර පිටු අංකය
			විස්තරය	ප්‍රමාණය	ඒකක මිල			
2008				රු	රු	රු		
1 5	152	රම්‍යා	කමිස	60	450	27 000		
			කලිසම්	120	800	96 000		
						123 000		
			අඩු කළා 5% වෙළෙඳ වට්ටම			6 150	116 850	
1 2	214	සුරම්‍යා	චීත්ත	මීටර 500	50	25 000		
			පොප්ලින්	මීටර 200	60	12 000		
			සුදු රෙදි	මීටර් 200	40	8 000		
						45 000		
			අඩු කළා 8% වෙළෙඳ වට්ටම			3 600	41 400	
1 25	316	ශුභ	ජපන් සාරි	40	1 500	60 000		
			ඉන්දියන් සාරි	60	1 200	72 000	132 000	
1 30	165	රම්‍යා	ඇඳ ඇතිරිලි	50	150	7 500		
			තුවා	40	125	5 000	12 500	
1 31		ගැනුම් ගිණුමට හර කළා					302 750	

ක්‍රියාකාරකම් 07

පාසල් ලිපි ද්‍රව්‍ය මිලට ගෙන නැවත විකිණීමේ කාර්යයෙහි නියුතු පෙරේරා ව්‍යාපාරයේ 2008 ජන. 31 අවසන් වූ මාසයේ ණයට ගැනුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ජන 05 . ඉන්වොයිසි අංක 45 යටතේ කුරේරාගෙන් ගත් භාණ්ඩ

එකක් රු 30 බැගින් චිත්‍ර පොත් 80

එකක් රු 80 බැගින් සී.ආර්. පොත් 50

එකක් රු 20 බැගින් ළමා කවි පොත් 120

(අඩු කළා වෙළෙඳ වට්ටම 10%)

නොමිලේ බෙදා හැරීම පිණිසයි

ජන 12 ඉන්වොයිසි අංක 216 යටතේ ලිවේරාගෙන් ගත් භාණ්ඩ
දුසිම් 01 ක් රු 115 බැගින් බෝල් පොයින්ට් පෑන් දුසිම් 20
දුසිම් 01ක් රු 45 බැගින් පැන්සල් උල් කරන උපකරණ දුසිම් 15

ජන 20 ඉන්වොයිසි අංක 82 යටතේ සිගේරාගෙන් ගත් භාණ්ඩ
පැකට් 1ක් රු 200 බැගින් බාග කඩදසි පැකට් 25
පැකට් 1ක් රු 300 බැගින් ඡායා පිටපත් පැකට් 40
පැකට් 1ක් රු 225 බැගින් රෝනියෝ කඩදසි පැකට් 30
(අඩු කළ වෙළෙඳ වට්ටම 5%)

ඉහත දක් වූ තොරතුරු ඇසුරෙන් 2008 ජනවාරි මාසය සඳහා විශ්ලේෂණ තීරු සහිත ගැනුම් ජ'නලය පිළියෙල කරන්න.

විකුණුම් පොත

නැවත විකිණීමේ පරමාර්ථයෙන් මිලට ගත් භාණ්ඩ ණයට විකිණීමේ දී භාවිත කරන මූලික පොත, විකුණුම් පොත හෙවත් විකුණුම් ජ'නලය වේ.

විකුණුම් ඉන්වොයිසියේ සඳහන් කරුණු පදනම් කර ගනිමින්, විකුණුම් ජ'නලය පිළියෙල කැරේ. වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීමේ දී අඩු කැරෙන වෙළෙඳ වට්ටම ඉන්වොයිසියේ සඳහන් වටිනාකමින් අඩු කර දක්විය යුතු ය.

විකුණුම් ජ'නලයක ආකෘතිය

දිනය	ඉන්වොයිසි අංකය	ගැනුම්කරු	භාණ්ඩ පිළිබඳ විස්තර				මුළු වටිනාකම	ලෙජර පිටු අංකය
			විස්තරය	ප්‍රමාණය	ඒකක මිල	වටිනාකම		

විකුණුම් ජ'නලයේ එකතුව, විකුණුම් ගිණුමට බැර කැරේ. ඒ ඒ ඉන්වොයිසි දිනට අදළ ශුද්ධ වටිනාකම් ගැනුම්කරුවන්ගේ (ණය ගැතියන්ගේ) ගිණුම්වලට හර කැරේ. එවිට ද්විත්ව සටහන සම්පූර්ණ වේ.

ක්‍රියාකාරකම් 08

පෙරේරා ව්‍යාපාරයේ 2008 ජන: 31 දිනෙන් අවසන් වූ මාසයට අදාළ ණයට විකුණුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ:

ජන 08. ඉන්වොයිසි අංක 006 යටතේ කුමුදුට විකුණූ භාණ්ඩ:

එකක් රු 45 බැගින් චිත්‍ර පොත් 25
එකක් රු 120 බැගින් සී ආර් පොත් 30
එකක් රු 30 බැගින් ළමා කථා පොත් 40
(අඩු කළ වෙළෙඳ වට්ටම 5%)

ජන 18 ඉන්වොයිසි අංක 007 යටතේ මානෙල්ට විකුණූ භාණ්ඩ:
දුසිම් 1ක් රු 160 බැගින් බෝල් පොයින්ට් පෑන් දුසිම් 10
දුසිම් 1ක් රු 60 බැගින් පැන්සල් උල් කිරීමේ උපකරණ දුසිම් 8
(අඩු කළ වෙළෙඳ වට්ටම 5%)

ජන 25 ඉන්වොයිසි අංක 008 යටතේ නෙළුම්ට විකුණූ භාණ්ඩ:
පැකට් 1ක් රු 250 බැගින් බාග කඩදසි පැකට් 10
පැකට් 1ක් රු 340 බැගින් ඡායා පිටපත් පැකට් 25
පැකට් 1ක් රු 300 බැගින් රෝනියෝ කඩදසි පැකට් 8
(අඩු කළ වෙළෙඳ වට්ටම 5%)

ජන 28 ඉන්වොයිසි අංක 009 යටතේ එකක් රු 400 බැගින් ගණක යන්ත්‍ර 25ක් කුමුදුට විකිණීම.


මූලාශ්‍ර ලේඛන
ගැනුම් ඉන්වොයිසිය
විකුණුම් ඉන්වොයිසිය
ලදු පත / ගෙවුම් වවුචරය
මූලික පොත්
ගැනුම් පොත (ගැනුම් ජ'නලය)
විකුණුම් පොත (විකුණුම් ජ'නලය)
මුදල් පොත (මුදල් ජ'නලය)
ලෙජර ගිණුම්
ආදායම් ගිණුම්
වියදම් ගිණුම්
වත්කම් ගිණුම්
හිමිකම් ගිණුම්
වගකීම් ගිණුම්
මූල්‍ය වාර්තා
ආදායම් ප්‍රකාශය
ශේෂ පත්‍රය



සාරාංශය

ව්‍යාපාරයක සම්පත් සීමිත නිසා සීමිත සම්පත් පාලනයේ දී ගිණුම්කරණයේ අවශ්‍යතාවත් එහි වැදගත්කමත් ඉස්මතු වේ. ව්‍යාපාර ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන රැස් කිරීම, මුදල් මාධ්‍යයෙන් වාර්තා කිරීම, වර්ග කිරීම, සාරාංශ කිරීම, විශ්ලේෂණය කිරීම, විවරණය කිරීම යන කටයුතු කිරීමත් තොරතුරු අවශ්‍ය පාර්ශ්ව වෙත ලබා දීමත්, ගිණුම්කරණයේ කාර්ය භාරය වේ.

ගිණුම්කරණ ඒකක සංකල්පය අනුව "එය හිමිකරුවන්ගෙන් වෙන් ව පවතී". යන්න මත ගිණුම්කරණ සමීකරණය ගොඩ නැගේ. මූලික ගිණුම්කරණ සමීකරණයේ අයිතම වන වත්කම්, හිමිකම් (ප්‍රාග්ධනය), වගකීම් යන ඒවායේ වෙනස් වීම් කෙරෙහි ව්‍යාපාරික ගනුදෙනු බලපායි. ගනුදෙනුවක ද්විත්ව බලපෑම ද්විත්ව සටහන් න්‍යායට අනුව පැහැදිලි කළ හැකි වේ.

ආදායම් ප්‍රකාශයට ආදායම් ද වියදම් ද ඇතුළත් කර ගිණුම් කාලච්ඡේදයට අදාළ ලාභය හෝ අලාභය හෝ ගණනය කැරේ. ශේෂ පත්‍රයට වත්කම් ද හිමිකම් ද වගකීම් ද ඇතුළත් කර මූල්‍ය තත්ත්වය අනාවරණය කැරේ.

ව්‍යාපාරයක සිදු වන සෑම මුදල් ගනුදෙනුවකට මෙන් ම ණය ගනුදෙනුවකට ද අදාළව මූලාශ්‍ර ලේඛන බිහි වේ. එකී මූලාශ්‍ර ලේඛන පදනම් කර ගනිමින් මූලික පොත් පිළියෙල කැරේ.

ව්‍යාපාර සැලැස්මකින් මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමේ දී ගිණුම්කරණයේ පදනම භාවිතයට ගැනේ.

ක්‍රියාකාරකම්

(01) i) මූලික ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ:
වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්

ඉහත සමීකරණය පහත සඳහන් අයුරු දක්වන්න.
- ප්‍රාග්ධනය නිරූපණය වන පරිදි
- වගකීම් නිරූපණය වන පරිදි

ii) වගුවේ හිස් තැන් පුරවන්න.

වත්කම්	=	ප්‍රාග්ධනය	+	වගකීම්
90 000		60 000		....
120 000		....		40 000
....		90 000		50 000
150 000		....		0
....		160 000		0

iii) හිස් තැනට ගැළපෙන සුදුසු ගිණුම්කරණ පදය ලියන්න.

1. වත්කම් = වගකීම් + ...
2. ස්ථාවර වත්කම් + ... = ... + ප්‍රාග්ධනය
3. ස්ථාවර වත්කම් +.................. = දිගු කාලීන වගකීම් + ප්‍රාග්ධනය

iv) වගුවේ හිස් තැන් පුරවන්න.

	ස්ථාවර වත්කම් +	ජංගම වත්කම් =	ප්‍රාග්ධනය +	දිගුකාලීන වගකීම්+	ජංගම වගකීම්
01	40 000	60 000	....	25 000	30 000
02	50 000	....	90 000	35 000	45 000
03	....	120 000	150 000	40 000	20 000
04	120 000	160 000	180 000	20 000	....
05	145 000	195 000	200 000	....	45 000
06	250 000	....	210 000	0	90 000
07	350 000	242 000	....	0	125 000
08	....	20 000	95 000	95 000	36 000

(02) i) පහත සඳහන් එක් එක් කාර්යයට අදාළ සැබෑ මූලාශ්‍ර ලේඛනය එක්රැස් කරන්න.

1. අත්පිට භාණ්ඩ විකිණීම
2. සේවක වැටුප් ගෙවීම
3. වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම
4. වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම.

ii) ඉහත සඳහන් එක් එක් කාර්යය සම්බන්ධයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

කාර්යය	මූලාශ්‍ර ලේඛන	සටහන් කැරෙන මූලික පොත
1. අත්පිට භාණ්ඩ විකිණීම	....	....
2. සේවක වැටුප් ගෙවීම	....	....
3. වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම	....	....
4. වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම	....	....

iii) පහත සඳහන් මූලාශ්‍ර ලේඛන අවශ්‍ය වන්නේ කුමක් සඳහා ද යන්නට හේතුව ලියන්න.

මූලාශ්‍ර ලේඛනය	හේතුව
1. මුදල් ලදු පත	
2. ගෙවුම් වවුචරය	
3. ගැනුම් ඉන්වොයිසිය	
4. විකුණුම් ඉන්වොයිසිය	

(03) රූපලාවණ්‍ය නිෂ්පාදිත මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ නිශාන්ති 20080331 දිනෙන් අවසන් මාස තුනට අදළ ගනුදෙනු පිළිබඳ ව පහත සඳහන් විස්තර ඔබට සපයා ඇත.

ලොතරැයි දිනුමකින් ලත් රුපියල් මිලියනයක මුදලින් රු 600 000ක මුදලක් යොද 20080101 දින ව්‍යාපාර කටයුතු අරඹා ඇත. ව්‍යාපාර කටයුතු සඳහා රු 25 000ක ලී බඩු ද රු 12 000ක උපකරණ ද රූපලාවණ්‍ය කටයුතු සඳහා රු 245 000ක ද්‍රව්‍ය ද මිල දී ගෙන ඇත.

ව්‍යාපාර කටයුතු සඳහා රු 400 000ක වටිනාකමකින් යුත් මෝටර් රථයක් මිල දී ගැනීමේ දී රු 250 000ක ණය මුදලක් බැංකුවෙන් ලබා ගෙන ඇති අතර ඉතුරු

මුදල ව්‍යාපාරයෙන් ගෙන ඇත. ණය මුදල වර්ෂ 5කින් ගෙවිය යුතු අතර වාර්ෂික ණය පොළී ප්‍රතිශතය 12%ක් වේ. ණය පොළී කිසිවක් මෙතෙක් ගෙවා නැත. මසකට රු 5 000 බැගින් වැටුප් ගෙවීමේ පොරොන්දුව මත සේවිකාවන් දෙ දෙනකු බඳවා ගෙන ඇති අතර 2008 මාර්තු මාසයේ වැටුප් තව ම ගෙවා නැත.

රු 35 000ක ප්‍රචාරණ වියදමක් ද රු 4 500ක දුරකථන ගාස්තු ද රු 6 500ක විදුලි ගාස්තු ද රු 8 000ක අනෙකුත් වියදම් ද දරා ඇති අතර රු 420 000ක සේවා ආදයමක් උපයා ඇත. ඉපැයීම්වලින් රු 60 000ක මුදලක් ගනුදෙනුකරුවන්ගෙන් 20080331 වන විට ලැබීමට ඇත. එදිනට ඉතුරු රූපලාවණ්‍ය ද්‍රව්‍ය තොගය රු 45 000ක් විය. ස්ථාවර වත්කම්වලින් වාර්ෂික ව ක්ෂය කළ යුතු ප්‍රතිශතය 10% වේ.

පහත සඳහන් දෑ පිළියෙල කර දෙන මෙන් ඇය ඔබගෙන් ඉල්ලා සිටී.

i) මාස තුනේ කාලච්ඡේදය තුළ ව්‍යාපාරයට ලැබුණු මුදල් ද ව්‍යාපාරයෙන් ගෙවූ මුදල් ද මුදල් පොතට ඇතුළත් කර 20080331 දිනට මුදල් ශේෂය ගණනය කර දීම.

ii) 20080331 දිනෙන් අවසන් වූ මාස තුනට අදාළ ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය හෝ ගණනය කිරීම සඳහා ආදයම් ප්‍රකාශය පිළියෙල කර දීම.

iii) 20080331 දිනට ව්‍යාපාරයේ ශේෂ පත්‍රය සකස් කර දීම.